දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
சுதேச மருத்துவத்துறை அமைச்சு
Ministry of Indigenous Medicine

# හෝමියෝපති වෛද්‍ය සභාව
# ஹோமியோபதி மருத்துவ சபை
# Homoeopathic Medical Council

වාර්ෂික වාර්තාව - 2014
ஆண்டறிக்கை - 2014
Annual Report - 2014

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# හෝමියෝපති වෛද්‍ය සභාව

## වාර්ෂික වාර්තාව

## 2014

# පටුන

පිටුව


| | | |
|---|---|---|
| 1. | සාරාංශය | 02 |
| 2. | හැඳින්වීම | 03 |
| 3. | හෝමියෝපති වෛද්‍ය සභාව | 04 |
| 4. | පසුබිම් විස්තරය | 05 |
| 5. | වෛද්‍ය සභාවේ අරමුණු | 08 |
| 6. | වෛද්‍ය සභාව සතු බලතල | 09 |
| 7. | වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය | 11 |
| 8. | සංස්ථාපිත තොරතුරු | 12 |
| 9. | වෛද්‍ය සභාවේ ක්‍රියාකාරී සැලැස්ම | 13 |
| 10. | හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | 15 |
| 11. | විගණන වාර්තාව | 24 |
| 12. | සුභාසිංශන | 25 |

# 01. සාරාංශය

2014 වසරේ හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව මෙසේ එළි දක්වන අතර, හෝමියෝපති වෛද්‍ය සභාව 2014 වසරේ අනුගමනය කල සමස්ත ක්‍රියා මාර්ග සහ ඒවා පිළිබඳ ඇගයීමක් ඉදිරිපත් කිරීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීම මඟින් අපේක්ෂා කෙරේ.

වාර්ෂිකව ඉටු කරනු ලබන වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම මඟින් බලාපොරොත්තු වන හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු, සැලසුම්, උපාය මාර්ග හා වසර තුළ අනුගමනය කල සංයුක්ත ක්‍රියා මාර්ග පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා, ගරු ඇමතිතුමා හා ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සමස්ත දේශපාලන විධායකයේත්, ව්‍යවස්ථාදායකයේත්, මගපෙන්වීමක් ලබා ගැනීම 2014 වාර්ෂික වාර්තාව එළි දැක්වීමේ අරමුණ වන බව සඳහන් කළ යුතුය.

2014 වසරේදීද හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ අතුරු පාලක කමිටුවක් මඟිනි. පෙර වසරේදී මෙන්ම මෙම වසරේදී ද හෝමියෝපති වෛද්‍යවරුන් තිදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක උපදෙස් සහ සහාය එයට ලැබුණි.

නව හෝමියෝපති පනතක් සම්මත කර හෝමියෝපති වෛද්‍ය සභාව පත්වන තෙක් වෛද්‍ය සභාව මඟින් සැලසෙන සේවාවන් ස්ථාවර මට්ටමකට ගෙන ඒම සඳහා ආයතනයේ ස්ථාවරත්වය ගොඩනැඟීම අත්‍යාවශ්‍ය වන බව සැලකූ හෝමියෝපති අතුරු පාලක කමිටුව, පුරප්පාඩු තනතුරු සඳහා කාර්ය මණ්ඩලයට බඳවා ගැනීම, නව සායන ආරම්භ කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම, පවත්වාගෙන යන සායන රජයේ ස්ථිර ගොඩනැඟිලි වල ස්ථාපිත කිරීම වැනි කටයුතු සඳහා ප්‍රමුඛතාව දෙමින් කටයුතු කරන ලදී. ඒ අනුව හෝමියෝපති පනත මඟින් ලැබී ඇති බලතල පරිදි ගරු ඇමතිතුමාගේ උපදෙස් හා නියෝග මත පනතේ 27 (1) C වගන්තිය යටතේ නව වෛද්‍යවරුන් 27 දෙනෙකු වෙත ලියාපදිංචිය ලබාදීමට ක්‍රියා කරන ලදී. එමෙන්ම පනතේ 27(5) වගන්තිය යටතේ පවත්වන ලද විභාගයෙන් සමත්වූ හෝමියෝපති තාවකාලික වෛද්‍යවරුන් 19 දෙනෙකු සාමාන්‍ය ලේඛණයේ ලියාපදිංචි කිරීමට කටයුතු කර ඇත.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම සඳහා මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම හෝමියෝපති වෛද්‍ය සභාවේ මූලික අරමුණ වේ. රේඛීය අමාත්‍යාංශය වූ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හෝමියෝපති වෛද්‍ය සභාව පිළිබඳ අරමුණ වූයේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම සඳහා උපාය, උපක්‍රම හඳුන්වා දීමය. මෙම ආයතන දෙකෙහිම අභිමතාර්ථයන් සාධනය කිරීමෙහිලා වැදගත් අවස්ථාවක් උදා කර ගැනීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂා කර ඇත.

# 02. හැඳින්වීම

“සමාන දෙයින් සමාන දෙය නැසීම” යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැක. 18 වන ශත වර්ෂයේ ජර්මන් ජාතික විද්‍යාඥයකු වූ ක්‍රිස්ටියන් ෆෙඩ්‍රික් සැමුවෙල් හානිමාන් යන වෛද්‍යවරයා මෙම වෛද්‍ය ක්‍රමයේ නිර්මාතෘ මෙන්ම, වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත කිරීමටද මහඟු සේවයක් කළ තැනැත්තෙකි. අද දින හෝමියෝපති ක්‍රමය පිළිගත් වෛද්‍ය ක්‍රමයක් ලෙස ලෝකයේ බොහෝ රටවල භාවිත කරයි. උදාහරණයක් ලෙස ඉන්දියානු රජය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, රට පුරා විහිදුනු හෝමියෝපති සායන හා රෝහල් මඟින් හෝමියෝපති ප්‍රතිකාර මහජනතාවට ලබාදේ.

1970 අංක 07 දරණ පනතේ 1 වන කොටසේ, 2 වන වගන්තියේ, 1 වන උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කර ඇත.

ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් අතුරින් තෝරා පත් කර ගනු ලබන හත් දෙනෙකුගෙන් හෝමියෝපති වෛද්‍ය සභාව සමන්විත වේ. ( මේ වන විට හෝමියෝපති වෛද්‍ය සභාව විසුරුවා හැර ඇති අතර එහි කටයුතු අතුරු පාලක කමිටුවක් මඟින් පාලනය වේ.) ලේඛකාධිකාරී හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේකම් වේ.

මෙම සභාව මඟින් මෙහෙය වෙන රජයේ හෝමියෝපති සායන 07 ක් ස්ථාන හතක පිහිටුවා ඇත. දෙහිවල, පරකඩුව,මොණරාගල, පාලමුණෙ, මාතලේ කුරුණෑගල හා තෝලංගමුව එම ස්ථාන වේ.

## 03. හෝමියෝපති වෛද්‍ය සභාව

දැක්ම

''හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම''

මෙහෙවර

''හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නඟා සිටුවීම හා අභිවර්ධනය කිරීම.''

පරමාර්ථ

**1970** අංක **07** දරණ හෝමියෝපති පනතේ විධි විධාන වලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මඟින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මඟින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

## 04. පසුබිම

හෝමියෝපති වෛද්‍ය සභාව ප්‍රධාන වශයෙන්ම වෘත්තීමය මණ්ඩලයකි. ප්‍රථම හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයන් හෝමියෝපති පනත ප්‍රකාරව විෂය භාර ගරු ඇමතිවරයා විසින් පත් කර ඇත. තදනන්තර වෛද්‍ය සභාවන් සඳහා සාමාජිකයන් ලියාපදිංචි හෝමියෝපති වෛද්‍යවරුන් අතර පවත්වන ඡන්දයක් මඟින් තෝරා පත්කර ගනු ලැබේ. ගරු විෂය භාර ඇමතිතුමාගේ නිර්දේශයන් හා ඇමතිතුමා ප්‍රකාශයට පත්කරන නියෝග වලට අනුකූලව හෝමියෝපති වෛද්‍ය සභාවේ රාජකාරි හා බලතල ක්‍රියාත්මක කළ යුතුය. හෝමියෝපති පනතට අනුව රෙගුලාසි සම්පාදනය කිරීමට හෝමියෝපති වෛද්‍ය සභාවට බලතල ඇත. එම රෙගුලාසි හෝමියෝපති පනතේ නියෝග වලට අනුකූලව ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කළ යුතුය.

### නීති සහ රෙගුලාසි

හෝමියෝපති ක්‍රමය රජය පිළිගත් වෛද්‍ය ක්‍රමයක්ව වසර 40ක පමණ කාලයක්ද, හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර වසර 30 කට වැඩි කාලයක්ද ගතව ඇතත් අවාසනාවකට මෙන් හෝමියෝපති පනත බලාත්මක විමට මෙතෙක් සම්පාදනය කර ඇත්තේ අවශ්‍ය රෙගුලාසි වලින් සුළු ප්‍රමාණයක් පමණි. මෙම තත්ත්වය හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ දියුණුවට බාධාවක් මෙන්ම පනත අභිබවා යමින් නොයෙක් වංචා සිදු කිරීමටද පිටිවහලක්ව ඇත. තවද මේ නිසා වෛද්‍ය සභාවට තම අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට නොහැකිවී ඇති අතර , නිසි ලෙස බලාත්මක වීමටද නොහැකිවී ඇත.

**මෙතෙක් ප්‍රකාශයට පත් කළ අනු නීති**

1. වෛද්‍ය සභාවේ නීති - 1981
2. හෝමියෝපති රෙගුලාසි - 1980

(වෛද්‍ය වෘත්තිකයින්ගේ රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)

3. හෝමියෝපති සභාවේ නීති - 1983
4. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

## හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම

පළමු හෝමියෝපති වෛද්‍ය සභාව 1979 වසරේදී ස්ථාපිත කර ඇත. ගරු ඇමතිතුමා විසින් පනතේ නියෝග වලට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවට සාමාජිකයින් පත්කරමින් හෝමියෝපති පනත බලාත්මක කර ඇත. තදනන්තර වෛද්‍ය සභාවන්හි සාමාජිකයින් හෝමියෝපති පනතේ රෙගුලාසි වලට අනුකූලව හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ඡන්දයක් පවත්වා තෝරා පත් කර ගෙන ඇත. තෙවන හෝමියෝපති වෛද්‍ය සභාව පනතේ නියෝග වලට අනුකූලව වෛද්‍ය සභාවේ සාමාජිකයන් ධූර වලින් පහ කර ඇත.

## හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයන්

- ප්‍රථම හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයන් ගරු ඇමතිතුමා විසින් පනතේ නියෝග වලට අනුකූලව පත්කරන ලදී. (1979-1989)

- ඉන් පසු වසර 10 ක් පමණ වෛද්‍ය සභා නිලවරණ රෙගුලාසි සම්පාදනය නොකිරීම නිසා වෛද්‍ය සභාව අකර්මණ්‍යව පැවතිණ. (1989-1998)

- නිලවරණයක් පවත්වා වසර 5 ක කාල සීමාවකට 1998 සැප්තැම්බර් මස වෛද්‍ය සභාව තෝරා පත් කර ගන්නා ලදී. (1998-2003)

- නැවත වසර 03ක පමණ කාලයක් විෂය භාර අමාත්‍යාංශය මාරුවීම සහ නොයෙකුත් නීතිමය කරුණු නිසා වෛද්‍ය සභාව අකර්මණ්‍යව පැවතින. (2003 -2006 )

- තෙවන වෛද්‍ය සභාව 2006 වසරේදී නිලවරණයක් මගින් තෝරා පත් කර ගත් අතර එය 2009 ජූලි මාසය දක්වා පැවතිණ. ගරු අමාත්‍යතුමා 2009 ඔක්තෝබර් මස වෛද්‍ය සභා සාමාජිකයින් ධූර වලින් ඉවත් කර එම තනතුරු සඳහා නව සාමාජිකයින් පත් කරන ලදී.

- ගරු ඇමතිතුමා විසින් 2009.10.29 දිනැති අංක 1625 දරණ විශේෂ ගැසට් නිවේදනයක් අනුව විසුරුවා හරින ලද වෛද්‍ය සභාවේ ඉතිරි වසර දෙක සඳහා වෛද්‍ය සභාවක් පත් කරන ලදී. එම වෛද්‍ය සභාවේ කාලය නිමවීමත් සමඟ 2011 ජනවාරි 30 වන දින එම වෛද්‍ය සභාව අහෝසි විය.

- එතැන් පටන් 2011 ජූනි 16 දින දක්වා වෛද්‍ය සභාවක් නොපැවතුණි.

- ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හා ගරු නීතිපතිතුමාගේ උපදෙස් පරිදි ගරු විෂය භාර ඇමතිතුමා විසින් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා 2011 ජූනි 16 හෝමියෝපති අතුරු පාලක කමිටුවක් පත් කරන ලදී. එතැන් පටන් අද දක්වා වෛද්‍ය සභාවට අයත් කටයුතු ක්‍රියාත්මක කරනු ලබන්නේ අතුරු පාලක කමිටුව මගිනි.

## 05. වෛද්‍ය සභාවේ අරමුණු

**හෝමියෝපති වෛද්‍ය සභාවේ අභිමතාර්ථ පහත සඳහන් පරිදිය.**

1. හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචිය හා ලියාපදිංචිය තාවකාලිකව නැවැත්වීම.

2. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ නියමයන් හා වෘත්තීමය ආචාර ධර්ම සුරක්ෂිත කිරීම.

3. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත කිරීම සහ ධෛර්යමත් කිරීම මෙන්ම හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම.

4. හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හා ආයතන ස්ථාපිත කිරීම සහ නෛතිකව පිළිගැනීම.

5. හෝමියෝපති ඖෂධ හා විලවුන් නිෂ්පාදනය , ආනයනය , වෙළඳාම , පාලනය සහ නියාමනය.

6. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හා මහජන සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමට පොත්පත් , සඟරා ප්‍රකාශයට පත් කිරීම.

7. හෝමියෝපති පනතට අනුකූලව නීති සහ ආචාරධර්ම ප්‍රකාශයට පත් කිරීම.

8. හෝමියෝපති පනතේ නියෝග වලට අනුකූලව වෘත්තීමය මණ්ඩලයක් වශයෙන් හෝමියෝපති වෘත්තිකයන්ගේ හා සාමාජික වගකීම් පිළිබඳව ගරු ඇමතිතුමා දැනුවත් කිරීම.

## 06. වෛද්‍ය සභාව සතු බලතල

හෝමියෝපති පනතේ 23 වන නියෝග පරිදි වෛද්‍ය සභාව සතු බලතල පහත සඳහන් පරිදි වේ.

1. හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම.

2. අවස්ථානුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාල අනුමත කර පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

3. පිළිගත් වෛද්‍ය විද්‍යායතන සඳහා වූ පාඨමාලා විෂය නිර්දේශ හා සංස්කරණ පාඨමාලා සඳහා වූ විෂය නිර්දේශ නියම කිරීම.

4. පිළිගත් වෛද්‍ය විද්‍යායතනයන්හි අධ්‍යාපනය ලබන සිසුන්ට විභාග පවත්වා උපාධි හෝ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

5. විභාග ගාස්තු හා ඇතුළත්වීමේ ගාස්තු වශයෙන් මුදල් නියම කර සිටීම සහ අයකර ගැනීම.

6. පිළිගත් වෛද්‍ය විද්‍යායතනයන්හි තත්ත්වය හා ගුණාත්මක වර්ධනය පරීක්ෂා කිරීම, නිරීක්ෂණය කිරීම හා අධ්‍යාපන තත්ත්වයන් පිළිබඳ තහවුරු කිරීම.

7. වෛද්‍ය සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන විභාග පැවැත්වීමට සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි වෛද්‍යවරුන් මෙන්ම බාහිර පරීක්ෂකවරුන්ද පත්කිරීම.

8. පනතේ විධිවිධාන හා අපේක්ෂිත නිර්දේශ හා නිර්ණායකයන් අනුව කටයුතු නොකරන වෛද්‍ය විද්‍යායතන තහනම් කිරීම හෝ පිළිගැනීම අත් හිටුවීම. (එසේ කිරීමට පෙර එම ආයතන පාලක සභාවට නිවැරදි කිරීමට අවශ්‍ය වෙනස්කම් කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුය.)

9. හෝමියෝපති පර්යේෂණ ආයතන පිහිටුවීම, පශ්චාත් උපාධි පාඨමාලා සංවිධානය කිරීම, හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය සඳහා පියවර ගැනීම.

10. හෝමියෝපති සඟරාවන් ප්‍රකාශයට පත් කිරීම.

11. පනතේ අපේක්ෂාවන් හා වෛද්‍ය සභාවේ අරමුණු සඵල කරගැනීම සඳහා හෝමියෝපති අරමුදලේ මුදල් පරිහරණය කිරීම.

12. පනතේ සඳහන් අරමුණු හා හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ අභිවෘද්ධියට අදාළ වෛද්‍ය සභාවේ අපේක්ෂාවන් ඉටුකිරීම.

13. වෛද්‍ය සභාවේ කාර්යයන් විධිමත්ව ඉටු කිරීමට හා පනතේ විධිවිධාන බලාත්මක කිරීමට රෙගුලාසි සම්පාදනය කර ගරු ඇමතිතුමා විසින් අවශ්‍ය රෙගුලාසි පාර්ලිමේන්තුවෙන් අනුමත කරවා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරීම.

## 07. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධූර කාලය

හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සභාපතිද ඇතුළුව හෝමියෝපති වෛද්‍යවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ ඡන්දයෙන් හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාජිකයින් තෝරා පත් කර ගනු ලැබේ. වෛද්‍ය සභාවේ ලේකම් / ලේඛකාධිකාරී පත්කරනු ලබන්නේ වෛද්‍ය සභාව විසිනි. වෛද්‍ය සභාවට තේරී පත් වූ සාමාජික / සාමාජිකාවන් අතරින් වෛද්‍ය සභාවේ සභාපති ගරු ඇමතිතුමා විසින් පත් කරනු ලැබේ.

1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාව නීත්‍යානුකූලව බලාත්මක වනුයේ එය ගරු ඇමතිතුමා විසින් ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසුවය. වෛද්‍ය සභාව තෝරා පත් කර ගනු ලබන්නේ වසර 05 ක කාලයක් සඳහාය.

## 08. සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| **ආයතනයේ නම** | :- | හෝමියෝපති වෛද්‍ය සභාව. |
| **ලිපිනය** | :- | අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම. |
| **දුරකථන අංකය** | :- | 011-2958175 |
| **ෆැක්ස්** | :- | 011-2958175 |
| **විද්‍යුත් තැපැල** | :- | homosri.mcouncil@gmail. Com |
| **සංස්ථාපිත ආයතනයේ තත්ත්වය** | :- | 1970 අංක 07 දරණ හෝමියෝපති පනතේ 22 හා 23 වගන්ති ප්‍රකාරව බලතල සහ පරමාර්ථ සහිතව හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර ඇත. |
| **පරිපාලන ව්‍යුහය** | :- | ලේකම් / ලේඛකාධිකාරී<br>කාර්යභාර වෛද්‍යවරු<br>කළමනාකරණ සහකාර<br>ඖෂධ සංයෝජක<br>කාර්යාල සහායක |
| බැංකුකරුවෝ | :- | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව, කොළඹ<br>කොමර්ෂල් බැංකුව - ජා ඇල ශාඛාව |

# 09. ක්‍රියාකාරී සැලැස්ම - 2014

## සාරාංශය

<u>**අරමුණ 01**</u>

- හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා නිසි පිළිගැනීමක් ලබාදීම.

<u>උපාය මාර්ග</u>

- ප්‍රතිකාර ලබා දීම තුළින් මහජන විශ්වාසය ගොඩනැගීම.
- වැඩිහිටියන් සහ ළමුන් තුළ වෛද්‍ය ක්‍රමය පිළිබඳ විශ්වාසය ගොඩනැගීම.
- අමාත්‍යාංශයේ සහ සියළුම ආයතන වල නිලධාරීන් දැනුවත් කිරීම.
- මාධ්‍ය මඟින් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ ප්‍රචාරයක් ලබා දීම.
- හෝමියෝපති වෛද්‍යවරුන් අතර සුහදත්වය වර්ධනය කිරීම.
- අමාත්‍යාංශයේ නම වෙනස් කිරීම. ( ‘‘හෝමියෝපති’’ යන්නද ඇතුලත් වන සේ)

<u>**අරමුණ 02**</u>

- හෝමියෝපති සභාව සඳහා පිළිගත් නිශ්චිත පරිපාලන පරිපාටියක් හඳුන්වාදීම.

<u>උපාය මාර්ග</u>

- හෝමියෝපති වෛද්‍ය සභාවේ පරිපාලන ප්‍රතිපත්තිය පිළිබඳ රෙගුලාසි සම්පාදනය කිරීම.

**<u>අරමුණ 03</u>**

- හෝමියෝපති මහජන සෞඛ්‍ය සේවාවක් ප්‍රතිස්ථාපනය කිරීම.

<u>උපාය මාර්ග</u>

- බඳවා ගැනීමේ ව්‍යුහයේ වෙනස්කම් අනුමත කර ගැනීම.
- වැටුප් සහ සේවක සංඛ්‍යාව.
- කොමිසමේ අනුමැතිය ලබා ගැනීම.

**<u>අරමුණ 04</u>**

- හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් බිහිකිරීම හා පරිපූරක වෛද්‍යවරුන් බිහි කිරීම සහ ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.

<u>උපාය මාර්ග</u>

- අතුරු නීති සම්පාදනය , පිළිගැනීම සහ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය පිහිටුවීම.

**<u>අරමුණ 05</u>**

- හෝමියෝපති ඖෂධ හා නිෂ්පාදන පිළිබඳ වෙළඳ පොළ සුලභතාවය තහවුරු කිරීම.

<u>උපාය මාර්ග</u>

- අතුරු නීති සම්පාදනය.
- හෝමියෝපති බෙහෙත් ගබඩා සහ ඔසුසල් පිහිටුවීම සඳහා අරමුදල් ගොඩනැගීම.

## 10. හෝමියෝපති වෛද්‍ය සභාවේ ක්‍රියාකාරීත්වය
## 2014 ජනවාරි සිට දෙසැම්බර්

### 10 -1 සායන කලමනාකරණය සහ පවත්වාගෙන යාම

- වෛද්‍ය සභාව යටතේ දිස්ත්‍රික් 07 ක පිහිටුවා ඇති රජයේ හෝමියෝපති වෛද්‍ය සායන 07 පවත්වාගෙන යාම.
- වෛද්‍ය සභාවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබන මෙම සායන වලට වැටුප් හා දීමනා ලබා දී ඇත.
- සායන පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා ලබා දීමට කටයුතු කර ඇත.
- මෙම සෑම සායනයක්ම අද වන විට රජයේ ගොඩනැගිලි කරා රැගෙනවිත් ඇත.

**සායන වල කාර්ය සාධනය**

වෛද්‍ය සභාව අධීක්ෂණය කරනු ලබන පහත සඳහන් සායන 7 තුළින් රෝගීන් 50353ක් වර්ෂය තුළ ප්‍රතිකාර ලබාගෙන ඇත.

| | සායනය | රෝගීන් ගණන |
|---|---|---|
| 1. | දෙහිවල | 7965 |
| 2. | මොණරාගල | 5736 |
| 3. | පාලමුනෙයි | 8753 |
| 4. | මාතලේ | 6461 |
| 5. | කුරුණෑගල | 8313 |
| 6. | පරකඩුව | 7854 |
| 7. | තෝලංගමුව | 5271 |
| | එකතුව | **50353** |

## 10 -2 අතුරු පාලක කමිටුව

2014 ජනවාරි 01 වෙනිදා පටන් බල පැවැත්වෙන පරිදි සාමාජික සාමාජිකාවන් 5 දෙනෙකුගෙන් යුත් අතුරු පාලක කමිටුවක් පත් කරන ලදී.

එහි සාමාජිකයන් වශයෙන්

1. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආචාර්ය නිව්ටන් පීරිස් මහතා - සභාපති

2. බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය කේ. කේ. ඩී. එස්. රණවීර මහතා - සාමාජික

3. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී
   එම්. ටී. ආර්. සී. චිත්‍රලතා මිය - සාමාජිකා

4. වෛද්‍ය එම්. එෆ්. ෆයාස් අහමඩ් මහතා - සාමාජික

5. වෛද්‍ය ඊ. එම්. සුපුන් මිණිමේඛලා මිය - සාමාජිකා

### අතුරු පාලක කමිටුවේ වෙනස්වීම්

එහෙත් චිත්‍රලතා මහත්මිය සිය ධූරයෙන් මාර්තු මස ඉල්ලා අස්විය. එමෙන්ම මෙම අතුරු පාලක කමිටුව සඳහා නව සාමාජික සාමාජිකාවන් තිදෙනෙක් මැයි මස දී ගරු ඇමතිතුමා විසින් පත් කරන ලද අතර එහිදී නැවතත් එම්. ටී. ආර්. සී. චිත්‍රලතා මිය පත් කරන ලදී. ඒ අනුව

01. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විජිතා සෙනෙවිරත්න මිය - සාමාජිකා

02. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී එම්. ටී. ආර්. සී. චිත්‍රලතා මිය - සාමාජිකා

03. නීතිඥ ඊ. එම්. පරාක්‍රම ඒකනායක මහතා - සාමාජික

ඉහත නම් සඳහන් අය  අතුරු පාලක කමිටුවට පත් කිරීම මත කමිටුවේ සාමාජික සංඛ්‍යාව 07 දක්වා ඉහළ යන ලදී.
වෛද්‍ය එම්. එෆ්. ෆයාස් අහමඩ් මහතා සහ වෛද්‍ය ඊ. එම්. සුපුන් මිණිමේබලා මිය හෝමියෝපති වෛද්‍ය සභාවේ වෛද්‍ය නිලධාරී තනතුරට අයදුම් කිරීම පිණිස නොවැම්බර් මාසයේදී අතුරු පාලක කමිටුවෙන් ඉල්ලා අස්විය.

## අතුරු පාලක කමිටු රැස්වීම්

| | | |
|---|---|---|
| 01. 2014.01.08 | - | 22 වන රැස්වීම |
| 02. 2014.01.18 | - | විශේෂ රැස්වීම |
| 03. 2014.03.27 | - | 23 වන රැස්වීම |
| 04. 2014.04.28 | - | 24 වන රැස්වීම |
| 05. 2014.05.08 | - | විශේෂ රැස්වීම I |
| 06. 2014.05.16 | - | විශේෂ රැස්වීම II |
| 07. 2014.05.27 | - | 25 වන රැස්වීම |
| 08. 2014.06.24 | - | 26 වන රැස්වීම |
| 09. 2014.07.21 | - | 27 වන රැස්වීම |
| 10. 2014.10.14 | - | 28 වන රැස්වීම |
| 11. 2014.12.31 | - | 29 වන රැස්වීම |

වර්ෂය තුළ පැවැත්වීමට හැකියාව ලැබුණේ විශේෂ රැස්වීම් 03ක්ද ඇතුලුව අතුරු පාලක කමිටු රැස්වීම් 11 ක් පමණි.

## 10 -3 හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් සහ නව බඳවා ගැනීම්.

| තනතුර | සංඛ්‍යාව | |
|---|---|---|
| 01. ලේඛකාධිකාරී | 01 | |
| 02. වෛද්‍ය වෘත්තික | 07 | (කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන සිටි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්ගේ සේවය 2014.12.31 දිනෙන් අවසන් විය) |
| 03. කළමනාකරණ සහකාර | 01 | ( හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ සේවය කළ එන්.පී.ජී.ජේ.පී.පල්ලියගුරු මෙනෙවිය 2014.06.16 දින සේවයෙන් ඉල්ලා අස්විය.) |
| 04. ඖෂධ සංයෝජක | 07 | |
| 05. කාර්යාල සහායක | 02 | (හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ කාර්යාල සහායකයින් ලෙස දෙදෙනෙකු 2014.08.01 දින සිට බඳවා ගන්නා ලදී.) |
| | **18** | |

## 10 -4 බඳවා ගැනීමේ පරිපාටිය හා කාර්ය මණ්ඩල වෙනස්වීම්

- හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ දින වැටුප් පදනම මත සේවය කළ අනියම් කාර්යාල සහායකයින් වූ එම්. පී. ප්‍රසන්න සුජිත් කුමාර මහතා 2014.01.02 දින සේවයෙන් ඉල්ලා අස් වූ අතර ඒ. එච්. සම්පත් අල්ගම මහතා 2014.01.22 දින සිට සේවය අතහැර යන ලදී.

- හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ සේවය කළ එන්. පී. ජී. ජේ. පී. පල්ලියගුරු මෙනෙවිය 2014.06.16 දින සිට සේවයෙන් ඉල්ලා අස්විය.

- කාර්යාල සහායකයින් ලෙස එස්. ඒ. රවී නිශාන් කුමාර සහ ආර්. එච්. ඒ. තිළිණ මධුසංඛ 2014.08.01 දින සිට හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ සේවයට බඳවා ගන්නා ලදී.

- 2014.11.21 වන දින ආධුනික නිලධාරිනියක ලෙස සේවයේ යොදවා ගැනීම සඳහා එල්. ඩබ්. සමාධි සුලෝචනා පෙරේරා මෙනෙවිය බඳවා ගන්නා ලදී.

- කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන සිටි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්ගේ සේවය 2014.12.31 දිනෙන් අවසන් විය. ඒ සඳහා බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව නව බඳවා ගැනීම් සිදු කරන ලදී.

- හෝමියෝපති සායන සඳහා ඖෂධ සංයෝජකයින් බඳවා ගැනීමේ දී අනිවාර්ය සුදුසුකමක් ලෙස දක්වා ඇති NVQ II වන මට්ටමේ සහතික නිකුත් කළ හැකි පාඨමාලාවක් ආරම්භ කිරීමට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ කටයුතු කරමින් සිටී.

## 10 -5 දත්ත හා කාලීන තොරතුරු

- 2014 වසර දක්වා ලියාපදිංචි වී ඇති වෛද්‍යවරුන්ගේ නාම ලේඛනය

| කාණ්ඩය | උපාධිධාරී | ඩිප්ලෝමාධාරී | සාමාන්‍ය | ලියාපදිංචි වූ මුළු වෛද්‍යවරු | ලියාපදිංචිය තහවුරු කර ගත යුතු |
|---|---|---|---|---|---|
| 27-1-a | 04 | 39 | | 43 | 02 |
| 27-1-b | 04 | | | 04 | |
| 27-1-c | | | 19 | 19 | |
| 27-2 | | | 43 | 43 | |
| 27-5 | | | 43 | 43 | |
| එකතුව | 08 | 39 | 105 | 152 | 02 |

සාරාංශය

| | ලියාපදිංචිය ලත් වෛද්‍යවරු | විධිමත් ලෙස ලියාපදිංචි නොවූ | 2013 වසර සඳහා ලියාපදිංචිය යාවත්කාලීන කළ | 2013 වසර සඳහා ලියාපදිංචිය යාවත්කාලීන නොකළ | මිය ගිය ගණන |
|---|---|---|---|---|---|
| මුළු ගණන | 197 | 02 | 113 | 39 | 43 |

නව වෛද්‍යවරුන් සඳහා ලියාපදිංචිය ලබා දීම.

- 1970 අංක 07 දරණ හෝමියෝපති පනතෙන් ලබාදී ඇති බලතල පරිදි ගරු ඇමතිතුමා විසින් ලබාදෙනු ලැබූ උපදෙස් අනුව හෝමියෝපති පනතේ 27 (1) C වගන්තිය යටතේ හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචිය සඳහා ක්‍රියා කරන ලදී. විශේෂ කමිටුවක් මඟින් පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ 92 දෙනෙකුගෙන් වෛද්‍යවරු 47 දෙනෙකු සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි කිරීමට ක්‍රියා කරන ලදී.

- පනතේ 27 (5) වගන්තිය යටතේ තාවකාලික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා පැවැත්වූ විභාගයෙන් සමත් වූ 19 දෙනෙකු සාමාන්‍ය ලේඛණයේ ලියාපදිංචි කිරීමට ක්‍රියා කර ඇත.

## 10 - 6 ඖෂධ ආනයනය සඳහා වෛද්‍ය වෘත්තිකයින් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම

- 2014 ජනවාරි සිට දෙසැම්බර් 30 දක්වා ඖෂධ ආනයනය සඳහා ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් 15 කට අනුමැතිය ලබා දී ඇත.
- ඒවායෙහි මුළු වටිනාකම

| | |
|---|---|
| US $ | 36857.13 |
| INDIAN RS | 137113.00 |

## 10 -7 අධිකරණ කටයුතු

**ශ්‍රේෂ්ඨාධිකරණය**

1. **FR / SC / 891 / 2009** හා **FR / SC / 965 / 2009** නඩුව.

   2009 වන විට වෛද්‍ය සභාවේ සිටි සාමාජිකයින් ගරු ඇමතිතුමා විසින් ධූර වලින් ඉවත් කිරීමට එරෙහිව පවරා ඇති මානව හිමිකම් නඩුව සහ ඒ හා බද්ධව වෛද්‍ය සභාව වහාම නැවත පිහිටුවීමට අවශ්‍ය නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා පවරා ඇති මෙම නඩුව විභාග වෙමින් පවතී.

2. **FR / 187 / 2013** නඩුව.

   2008 දෙසැම්බර් මස තාවකාලික ලියාපදිංචිය ලත් හෝමියෝපති වෛද්‍යවරුන් සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි කිරීම සඳහා හෝමියෝපති අතුරු පාලක කමිටුව වෙත නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොණු කළ 187/2013 (F/R) නඩුවේ තීන්දුව 2013.06.13 වන දින ලබා දුණි. එමඟින් පැමිණිලිකරුවන්ගේ ඉල්ලීමට ඉඩදෙමින් මාස 06ක් ඇතුළත අදාළ විභාගය පවත්වා ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කිරීමටත්, එමෙන්ම ඒ සඳහා ලියාපදිංචිය අවසන් වීමට තිබූ 2013.11.30 දින පටන් මාස 06ක් ඉදිරියට ඒ අයගේ තාවකාලික ලියාපදිංචි කාලය දීර්ඝ කිරීමටත් නියෝග කරන ලදී.

**3. FR / SC / 129/ 2014 නඩුව.**

2014 ජනවාරි මාසයේදී හෝමියෝපති අතුරු පාලක කමිටුව මඟින් ලියාපදිංචිය ලබා දුන් වෛද්‍යවරු 47 දෙනෙකුගේ ලියා පදිංචිය අහෝසි කරන ලෙසත් හෝමියෝපති තාවකාලික වෛද්‍යවරුන් සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි කිරීම සඳහා වන විභාගය පැවැත්වීමට හෝමියෝපති අතුරු පාලක කමිටුවට අවසර නොදෙන ලෙසත් හෝමියෝපති අතුරු පාලක කමිටුව අහෝසි කරන ලෙස නියෝගයක් නිකුත් කරන ලෙසත් ඉල්ලා පවරා ඇති නඩුව විභාගයට ගෙන ඇත.

4. හෝමියෝපති තාවකාලික වෛද්‍යවරුන් සඳහා විභාගය පැවැත්වීම අතුරු පාලක කමිටුවට ඉඩ නොදී හෝමියෝපති වෛද්‍ය සභාවක් පත්වන තෙක් කල් දමන ලෙස ඉල්ලා හෝමියෝපති තාවකාලික වෛද්‍යවරුන් තිදෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩු විභාගය අවසන්ව නැත.

**අභියාචනාධිකරණය**

**1. 87/2013 අංක දරණ නඩුව**

87/2013 අංක දරණ අභියාචනාධිකරණ නඩුව හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීම නතර කරන ලෙස නියෝගයක් ලබා දෙන ලෙස ඉල්ලා පැවරූ මෙම නඩු විභාගය අවසන්ව නැත.

**2. 146/2014 අංක දරණ නඩුව**

හෝමියෝපති තාවකාලික වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය දීර්ඝ කිරීම සහ හෝමියෝපති 1970 අංක 07 දරණ පනතේ 27(1) ඇ වගන්තිය යටතේ ලියාපදිංචිය අපේක්ෂා කර සම්මුඛ පරීක්ෂණයෙන් අසමත්වීම මත යළි ලියාපදිංචිය ඉල්ලා අභියාචනා ඉදිරිපත් කළ වෛද්‍යවරුන්ගේ අභියාචනා පිළිගන්නා ලෙසට නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා පැවරූ නඩුව විභාගයේ දී ලියාපදිංචිය සඳහා අදාළ විභාගය පැවැත්වීමටත් ඒ සඳහා මාස 06කට ඒ අයගේ ලියාපදිංචිය දීර්ඝ කිරීමටත් අභියාචනා ඉදිරිපත් කර ඇති අයගේ අභියාචනා පිළිගන්නා ලෙසටත් ගරු අභියාචනාධිකරණය සිය තීන්දුව ලබා දෙන ලදී.

### 3. CA/185/14 නඩුව

හෝමියෝපති පනතේ 27(1) ඇ වගන්තිය යටතේ ලියාපදිංචිය ලබා ගැනීමට නොහැකි වූ වෛද්‍යවරුන්ගෙන් මෙම වගන්තිය යටතේ ලියා පදිංචිය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවන ලෙසත් හෝමියෝපති පනතේ 27(5) වගන්තිය යටතේ සාමාන්‍ය ලේඛනයේ ලියා පදිංචිය ලැබීමට සුදුසු වෛද්‍යවරුන් සඳහා විභාගයක් පවත්වන ලෙසත් නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා පවරා ඇති නඩුව විභාගයට ගන්නා ලදී

## දිසා අධිකරණය

### 1. 31/52/2010 අංක දරණ නඩුව

වෛද්‍ය සභා කාර්යාලයේ කාර්යාල සභායක ලෙස සේවය කළ ඊ. එම්. ආර්. ඩී. සේරම් යන අය සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව වෛද්‍ය සභාව වග උත්තරකරු කරමින් පවරා ඇති නඩුව.

මෙම පැමිණිලිකරු විසින්ම මීගමුව දිසා අධිකරණයේ මෙම නඩු නිමිත්ත මතම එනම් " සේවය අවසන් කිරීම " මත හෝමියෝපති වෛද්‍ය සභාව, දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ තවත් අය විත්තිකරුවන් කරමින් පනවා ඇති නඩුව විභාග වන තෙක් කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති නඩුව විභාග කිරීම නවතා ඇත.

# 11.විගණන වාර්තාව

2014 වන විටත් හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවා නොතිබුණු බැවින්, මෙම වසර තුළද එහි කටයුතු මෙහෙය වනු ලැබුවේ හෝමියෝපති අතුරු පාලක කමිටුවක් මඟිනි. මූල්‍ය කටයුතු මෙහෙයවීම දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරන ලදී. 2014 වසර වෙනුවෙන් සැකසූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ශේෂ පිරික්සුම මේ සමඟ අමුණා ඇත.

2014 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමට අවශ්‍ය තත්ත්වයක් සැකසීම හා කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමට ක්‍රියාකිරීමෙන් සහ වෛද්‍යවරුන් ලියාපදිංචිය සඳහා අවශ්‍ය පියවර ගැනීමෙන්, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ගොඩනැඟීමට අවශ්‍ය මානව සම්පත් වර්ධනය කිරීම සඳහා මෙම වසර තුළදී හෝමියෝපති අතුරු පාලක කමිටුව ක්‍රියා කරන ලදී.

අමාත්‍යාංශය මඟින් කෙටුම්පත් කරමින් තිබූ නව හෝමියෝපති පනත පාර්ලිමේන්තුව මඟින් සම්මත කර හෝමියෝපති වෛද්‍ය සභාවක් හැකි ඉක්මණින් පත්කර ගැනීමේ අපේක්ෂාවෙන් සිටි අතුරු පාලක කමිටුව නව සභාවක් පත්වන තෙක් එහි කටයුතු පවත්වාගෙන යමින් අවශ්‍යතා සාධනයෙහි ලා ක්‍රියා කිරීමට යොමු විය.

ආචාර්යය නිව්ටන් ඒ. පීරිස්,
සභාපති,
හෝමියෝපති අතුරු පාලක කමිටුව.

# සුභාසිංශන

★ ★ ★ ★

ගරු දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු  නියෝජ්‍ය අමාත්‍යතුමා

වෛද්‍ය සභා සාමාජිකයින්

ලේකම්තුමා සහ අතිරේක ලේකම්තුමියන්

හෝමියෝපති අතුරු පාලක කමිටුවේ සභාපතිතුමිය

අතුරු පාලක කමිටු සාමාජිකයන් / සාමාජිකාවන්

නීතිපති දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

හා

කාර්ය මණ්ඩලය

**හෝමියෝපති වෛද්‍ය සභාව**

**2014.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය**

| | | 2014 | 2013 |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | සටහන | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 2,124,884.00 | 1,828,095.00 |
| ජංගම නොවන වත්කම් | | | |
| පිරියත හා උපකරණ | 2 | 1,295,606.00 | 874,955.00 |
| ගොඩනැගිලි පුනරුත්තාපන | | 953,828.00 | 953,828.00 |
| වෙනත් උපකරණ | | 1,450.00 | |
| | | 2,250,884.00 | 1,828,783.00 |
| මුළු වත්කම් | | 4,375,768.00 | 3,656,878.00 |
| බැරකම් | | | |
| ජංගම බැරකම් | | | |
| ගෙවිය යුතු දෑ | 3 | 526,036.00 | 235,284.00 |
| ජංගම නොවන බැරකම් | | | - |
| මුළු බැරකම් | | 526,036.00 | 235,284.00 |
| ශුද්ධ වත්කම් | | **3,849,732.00** | **3,421,594.00** |
| | | 4,375,768.00 | 3,656,878.00 |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | | |
| ප්‍රාග්ධනය | | 2,562,144.00 | 2,562,144.00 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය | | 1,572,047.00 | 973,273.00 |
| සමුච්චිත ඌනතාවය | | (311,918.00) | (141,282.00) |
| පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම | | 27,459.00 | 27,459.00 |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | **3,849,732.00** | **3,421,594.00** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරණ බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ................................ | ................................ | ................................ | ................................ |
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සාමාජික | සකස් කළේ, |
| හෝමියෝපති | හෝමියෝපති | හෝමියෝපති | ගණකාධිකාරී |
| වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | දේශීය වෛද්‍ය |

විජිතා සෙනවිරත්න

ඩබ්.ඒ.සී.එස්. ප්‍රියදර්ශනී
ගණකාධිකාරී 1 පන්තිය
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
325. ආචාර්ය ඇන්.එම්. පෙරේරා මාවත
කොළඹ - 08.

| | 2014 | 2013 |
|---|---|---|
| සටහන 1. | | |
| මුදල් හා මුදල් සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,483,419.00 | 1,405,167.00 |
| ලංකා බැංකුව | 445,565.00 | 422,928.00 |
| ලංකා බැංකුව රාජගිරිය | 195,900.00 | - |
| | 2,124,884.00 | 1,828,095.00 |
| සටහන 2. | | |
| **පිරියත හා උපකරණ** | | |
| පිරියත හා උපකරණ (ගත්මිල) | 2,323,316.00 | 1,725,992.00 |
| අඩුකළා: | | |
| සමුච්චිත ක්ෂය | 1,027,710.00 | 851,037.00 |
| ශුද්ධ අගය | 1,295,606.00 | 874,955.00 |
| සටහන 3. | | |
| ගෙවිය යුතු දෑ | | |
| ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් | | 17,550.00 |
| ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල් | | 2,633.00 |
| ගෙවිය යුතු බෙහෙත් ශාලා ගාස්තු | 25,200.00 | 16,200.00 |
| ගෙවිය යුතු වෛද්‍ය සහා රැස්වීම් ගාස්තු | 16,000.00 | 20,000.00 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 125,616.00 | 85,616.00 |
| ගෙවිය යුතු දුරකතන ගාස්තු | 7,245.00 | 3,937.00 |
| ගෙවිය යුතු විදුලිය | 624.00 | 1,240.00 |
| ගෙවිය යුතු ගමන් වියදම් | 4,001.00 | 2,053.00 |
| ගෙවිය යුතු ජල ගාස්තු | 1,607.00 | 10,156.00 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 11,324.00 | 59,155.00 |
| ගෙවිය යුතු කාර්යාල උපකරණ අළුත් වැඩියා | | 16,744.00 |
| ගෙවිය යුතු සංග්‍රහ වියදම් | 796.00 | |
| ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු | 22,213.00 | |
| ගෙවිය යුතු ලිපිද්‍රව්‍ය වියදම් | 780.00 | |
| ගෙවිය යුතු හෝමියෝපති විභාගය සඳහා වූ වැය | 310,630.00 | |
| | 526,036.00 | 235,284.00 |

**සටහන 4**

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009)

අංක -1 ට අනුවය.

**සටහන 5**

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙන වේ.

ක්ෂය අනුපාතය 12%කි.

වත්කම්, වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද, එය අදාල සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබේ.

වත්කම්, වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද, අදාල සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ.

හෝමියෝපති වෛද්‍ය සභාව

**2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | සටහන | 2014 | 2013 |
|---|---|---|---|
| අයභාරය | | | |
| රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන | | 6,228,080.00 | 5,806,790.00 |
| වෙනත් අයභාර | 1 | 218,537.00 | 34,220.00 |
| බැංකු පොලී | | 85,056.00 | 112,419.00 |
| මුළු අයභාරය | | 6,531,673.00 | 5,953,429.00 |
| වියදම | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 2 | 5,153,573.00 | 4,866,152.00 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | 3 | 81,029.00 | 26,696.00 |
| ක්ෂය හා ක්‍රම ක්ෂය | | 176,673.00 | 119,312.00 |
| වෙනත් වියදම් | 4 | 1,284,230.00 | 902,252.00 |
| නීති ගාස්තු | | - | 142,000.00 |
| මූල්‍ය පිරිවැය (බැංකු ගාස්තු) | | 6,804.00 | 8,994.00 |
| මුළු වියදම | | 6,702,309.00 | 6,065,406.00 |
| කාලච්ඡේදය සඳහා ඌනතාවය | | (170,636.00) | (111,977.00) |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරණ බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සාමාජික | සකස් කළේ, |
| හෝමියෝපති | හෝමියෝපති | හෝමියෝපති | ගණකාධිකාරී |
| වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | දේශීය වෛද්‍ය |
| | | | අංශය |

**විජිතා සෙනවිරත්න**
අතිරේක ලේකම් (පාලන)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක.325, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත
කොළඹ 08.

කොළඹ 10.

**ඩී.ඒ.සී.එස්. ප්‍රියදර්ශනී**
ගණකාධිකාරී 1 පන්තිය
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
325, ආචාර්ය ඇන්.එම්. පෙරේරා මාවත
කොළඹ - 08.

| සටහන 1 | 2014 | 2013 |
|---|---|---|
| වෙනත් අයභාර | | |
| වාර්ෂික ගාස්තු | 9,137.00 | 6,300.00 |
| විවිධ ලැබීම් | 13,500.00 | 27,920.00 |
| හෝමියෝපති විභාගය සඳහා වූ ගාස්තු | 195,900.00 | - |
| | 218,537.00 | 34,220.00 |
| සටහන 2 | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 4,127,805.00 | 4,015,142.00 |
| සේවක අර්ථ සාධක අරමුදල් | 890,125.00 | 741,022.00 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 135,643.00 | 109,988.00 |
| | 5,153,573.00 | 4,866,152.00 |
| සටහන 3 | | |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 24,581.00 | 15,389.00 |
| සංග්‍රහ වියදම් | 56,448.00 | 11,307.00 |
| | 81,029.00 | 26,696.00 |
| සටහන 4 | | |
| වෙනත් වියදම් | | |
| විවිධ වියදම් | 50,131.00 | 117,509.00 |
| ගමන් වියදම් | 24,815.00 | 36,807.00 |
| බෙහෙත් ශාලා ගාස්තු | 151,020.00 | 153,650.00 |
| තැපැල් ගාස්තු | 6,050.00 | 7,240.00 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 116,000.00 | 116,000.00 |
| විගණන ගාස්තු | 40,000.00 | 45,616.00 |
| ජල ගාස්තු | 48,582.00 | 43,175.00 |
| විදුලිය ගාස්තු | 11,310.00 | 13,721.00 |
| දුරකථන ගාස්තු | 66,368.00 | 50,396.00 |
| මුද්‍රණ ගාස්තු | - | 45,000.00 |
| දැන්වීම් ගාස්තු | - | 141,208.00 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 5,556.00 | 97,023.00 |
| දැයට කිරුළ වියදම් | - | 20,306.00 |
| භාෂා පරිවර්තන ගාස්තු | 46,381.00 | 14,601.00 |
| වෛද්‍ය සායන සඳහා උපකරණ | 34,000.00 | - |
| හෝමියෝපති විභාගය සඳහා වූ වැය | 684,017.00 | - |
| | 1,284,230.00 | 902,252.00 |

සටහන 5

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009)

අංක -1 ට අනුවය. එසේම එහි "ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහා පෑම"
යන පරිදි ඉදිරිපත් කර ඇත.

## හෝමියෝපති වෛද්‍ය සභාව
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2014 | 2013 |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| ලැබීම් | | | |
| රජයෙන් ලද පුනරාවර්තන ප්‍රදානය | | 6,228,080.00 | 5,806,790.00 |
| බැංකු පොලී | | 85,056.00 | 112,419.00 |
| වෙනත් ලැබීම් | 1 | 218,537.00 | 34,220.00 |
| | | 6,531,673.00 | **5,953,429.00** |
| ගෙවීම් | | | |
| සේවක පිරිවැය | 2 | 5,221,587.00 | 4,828,814.00 |
| බැංකු පොලී (බැංකු ගාස්තු) | | 6,804.00 | 8,994.00 |
| වෙනත් ගෙවීම් | 3 | 1,006,493.00 | 977,976.00 |
| | | 6,234,884.00 | **5,815,784.00** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 296,789.00 | **137,645.00** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | | |
| රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය | | 597,324.00 | 973,273.00 |
| පිරියත හා උපකරණ මිලට ගැනීම | 4 | 597,324.00 | 973,273.00 |
| | | | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | |
| මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | 5 | 296,789.00 | 137,645.00 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදීවූ මුදල් හා මුදල් හා සමාන දෑ | 6 | 1,828,095.00 | 1,690,450.00 |
| කාලපරිච්ඡේදය අවසානයේදීවූ මුදල් හා මුදල් හා සමාන දෑ | 7 | 2,124,884.00 | 1,828,095.00 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරණ බව සහතික කරමු.

ලේඛකාධිකාරී
හෝමියෝපති
වෛද්‍ය සභාව

සභාපති
හෝමියෝපති වෛද්‍ය සභාව
අතිරේක ලේකම් (පාලන)
දේශීය වෛද්‍ය අංශය
අංක.325, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

කමිටු සාමාජික
හෝමියෝපති
වෛද්‍ය සභාව
කොළඹ 10.

සකස් කළේ,
ගණකාධිකාරී
දේශීය වෛද්‍ය අංශය
අංක.325, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත

| | 2014 | 2013 |
|---|---|---|
| සටහන 1 - අනෙකුත් ලැබීම් | | |
| විවිධ ආදායම් | 9,137.00 | 22,370.00 |
| වාර්ෂික ගාස්තු | 13,500.00 | 11,850.00 |
| හෝමියෝපති විභාගය සඳහා වූ ගාස්තු | 195,900.00 | |
| | 218,537.00 | 34,220.00 |
| සටහන 2 - සේවක පිරිවැය | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 4,175,636.00 | 3,997,987.00 |
| සේවක අර්ථ සාධක අරමුදල් | 907,675.00 | 723,472.00 |
| සේවා නියුක්ති භාර අරමුදල් | 138,276.00 | 107,355.00 |
| | 5,221,587.00 | 4,828,814.00 |
| සටහන 3 - අනෙකුත් ගෙවීම් | | |
| විවිධ වියදම් | 50,131.00 | 117,509.00 |
| ලිපිද්‍රව්‍ය | 23,801.00 | 15,389.00 |
| ගමන් වියදම් | 22,867.00 | 34,754.00 |
| බෙහෙත් ශාලා ගාස්තු | 142,020.00 | 151,850.00 |
| තැපැල් ගාස්තු | 6,050.00 | 7,240.00 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 120,000.00 | 96,000.00 |
| සංග්‍රහ වියදම් | 55,652.00 | 11,307.00 |
| ජල ගාස්තු | 57,131.00 | 33,587.00 |
| විදුලිය ගාස්තු | 11,926.00 | 13,208.00 |
| දුරකථන ගාස්තු | 63,060.00 | 53,738.00 |
| මුද්‍රණ ගාස්තු | - | 45,000.00 |
| දැන්වීම් ගාස්තු | - | 141,208.00 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 22,300.00 | 80,279.00 |
| දැයට කිරුළ වියදම් | - | 20,306.00 |
| භාෂා පරිවර්තන ගාස්තු | 24,168.00 | 14,601.00 |
| නීති වියදම් | - | 142,000.00 |
| හෝමියෝපති විභාගය සඳහා වූ වැය | 373,387.00 | |
| වෛද්‍ය සායන සඳහා උපකරණ | 34,000.00 | |
| | 1,006,493.00 | 977,976.00 |
| සටහන 4 - පිරියත හා උපකරණ මිලට ගැනීම | | |
| පාපැදියක් මිලට ගැනීම | | 10,845.00 |
| වතුර පිල්ටරයක් මිලදී ගැනීම | | 8,600.00 |
| ගොඩනැගිලි පුනරුත්තාපන වියදම් | | 953,828.00 |
| පරිගණකය (එච්පී) | 119,900.00 | |
| කණ,උගුර සහ නාසය පරීක්ෂා කිරීමේ උපකරණ | 140,000.00 | |
| බර කිරන තරාදි | 4,000.00 | |
| සීලිං විදුලි පංකා | 24,430.00 | |
| විදුලි පංකා (Pedestal) | 33,250.00 | |

| | | |
|---|---|---|
| පුටු - කැරකෙන | 37,632.00 | |
| ඇඳිපුටු (Fabric Cushion) | 159,712.00 | |
| වානේ අල්මාරි | 43,680.00 | |
| ඇඳිපුටු (ප්ලාස්ටික්) | 15,120.00 | |
| තේක්ක මේස අඩි 5*3 (ලාච්චු 02) | 19,600.00 | |
| | 597,324.00 | 973,273.00 |
| | | |
| සටහන 5 - මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | | |
| වර්ෂය අවසාන මුදල් ශේෂය | 2,124,884.00 | 1,828,095.00 |
| වර්ෂය ආරම්භක මුදල් ශේෂය | 1,828,095.00 | 1,690,450.00 |
| | 296,789.00 | 137,645.00 |
| සටහන 6 - කාලපරිච්ඡේදය ආරම්භයේවූ මුදල් හා මුදල් හා සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,405,167.00 | 1,301,742.00 |
| ලංකා බැංකුව | 422,928.00 | 388,708.00 |
| | 1,828,095.00 | **1,690,450.00** |
| සටහන 7 - කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ | | |
| කොමර්ෂල් බැංකුව | 1,483,419.00 | 1,405,167.00 |
| ලංකා බැංකුව | 445,565.00 | 422,928.00 |
| ලංකා බැංකුව රාජගිරිය | 195,900.00 | |
| | 2,124,884.00 | **1,828,095.00** |
| | 296,789.00 | **137,645.00** |
| සටහන 8 | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත/(ඌනතාවය) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමඟ සැසඳීම | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත/(ඌනතාවය) | (170,636.00) | (111,977.00) |
| මුදල් නොවන වෙනස් වීම් | | |
| ක්ෂය වීම් | 176,673.00 | 119,312.00 |
| ගෙවිය යුතු වැය වැඩිවීම (සටහන 9) | 290,752.00 | 130,310.00 |
| පෙර වර්ෂ ගැලපුම් ගිණුමේ වාර්ෂික වෙනස් වීම් | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 296,789.00 | 137,645.00 |

සටහන 9 - ගෙවිය යුතු වැය වැඩිවීම

| | 2013 සහ 2014 වර්ෂයන් සැසඳීම | | |
|---|---|---|---|
| | වාර්ෂික අඩුවීම | වාර්ෂික වැඩිවීම | ශුද්ධ වෙනස් වීම (+) / (-) |
| ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් | 17,550.00 | | |
| ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල් | 2,633.00 | | |
| ගෙවිය යුතු බෙහෙත් ශාලා ගාස්තු | | 9,000.00 | |
| ගෙවිය යුතු වෛද්‍ය සහා රැස්වීම් ගාස්තු | 4,000.00 | | |
| ගෙවිය යුතු විගණන ගාස්තු | | 40,000.00 | |
| ගෙවිය යුතු දුරකතන ගාස්තු | | 3,308.00 | |
| ගෙවිය යුතු විදුලිය | 616.00 | | |
| ගෙවිය යුතු ගමන් වියදම් | | 1,948.00 | |
| ගෙවිය යුතු ජල ගාස්තු | 8,549.00 | | |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 47,831.00 | | |
| ගෙවිය යුතු කාර්යාල උපකරණ අළුත් වැඩියා | 16,744.00 | | |
| ගෙවිය යුතු සංග්‍රහ වියදම් | | 796.00 | |
| ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු | | 22,213.00 | |
| ගෙවිය යුතු ලිපිද්‍රව්‍ය වියදම් | | 780.00 | |
| ගෙවිය යුතු හෝමියෝපති විභාගය සඳහා වූ වැය | | 310,630.00 | |
| | 97,923.00 | 388,675.00 | 290,752.00 |

**පෙර කාලපරිච්ඡේද වැරදි හෙළිදරව් කිරීම සහ නිවැරදි කිරීම.**

| ජර්නලය | | |
|---|---|---|
| | හර | බැර |
| ඌනතා ගිණුම | 52,119.00 | |
| පෙර වර්ෂ ගැලපුම් ගිණුම | | 52,116.00 |
| ක්ෂය වෙන් කිරීමේ ගිණුම | | 3.00 |
| | 52,119.00 | 52,119.00 |
| සංලක්ෂ්‍යය (2014 වර්ෂය සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී අනාවරණය වූ , 2013 වර්ෂයට අදාලව ..ව ඇති ගිණුම්කරණ දෝෂ, නිවැරදි කිරීම). | | |

හෝමියෝපති වෛද්‍ය සභාව

| | 2014.12.31 දිනට ශේෂ පිරික්සුම | | 2013.12.31 දිනට ගිණුම් නිවැරදි කිරීමෙන් පසු ශේෂ පිරික්සුම | |
|---|---|---|---|---|
| | හර රු. | බැර රු. | හර රු. | බැර රු. |
| විස්තරය | | | | |
| තැපැල් ගාස්තු | 6,050.00 | | 7,240.00 | |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 116,000.00 | | 116,000.00 | |
| මුද්‍රණ ගාස්තු | | | 45,000.00 | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | 4,127,805.00 | | 4,015,142.00 | |
| උපචිත කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | | 11,324.00 | | 59,155.00 |
| සේවක අර්ථ සාධක අරමුදල | 890,125.00 | | 741,022.00 | |
| උපචිත සේවක අර්ථ සාධක අරමුදල | | | | 17,550.00 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 135,643.00 | | 109,988.00 | |
| උපචිත සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | | | | 2,633.00 |
| දුරකතන ගාස්තු | 66,368.00 | | 50,396.00 | |
| උපචිත දුරකතන ගාස්තු | | 7,245.00 | | 3,937.00 |
| විවිධ වියදම් | 50,131.00 | | 117,509.00 | |
| ගමන් වියදම් | 24,815.00 | | 36,807.00 | |
| උපචිත ගමන් වියදම් | | 4,001.00 | | 2,053.00 |
| කාර්යාල උපකරණ | 1,450.00 | | | |
| සායන සඳහා උපකරණ | 34,000.00 | | | |
| කාර්යාල උපකරණ අලුත්වැඩියා | 5,556.00 | | 97,023.00 | |
| ජල ගාස්තු | 48,582.00 | | 43,175.00 | |
| උපචිත ජල ගාස්තු | | 1,607.00 | | 10,156.00 |
| විදුලි ගාස්තු | 11,310.00 | | 13,721.00 | |

| | 2014.12.31 දිනට ශේෂ පිරික්සුම | | 2013.12.31 දිනට ගිණුම් නිවැරදි කිරීමෙන් පසු ශේෂ පිරික්සුම | |
|---|---|---|---|---|
| උපචිත විදුලි ගාස්තු | | 624.00 | | 1,240.00 |
| විගණන ගාස්තු | 40,000.00 | | 45,616.00 | |
| විගණන ගාස්තු වෙන්කිරීම | | 125,616.00 | | 85,616.00 |
| බැංකු ගාස්තු | 6,804.00 | | 8,994.00 | |
| රජයේ ප්‍රතිපාදන - පුනරාවර්තන | | 6,228,080.00 | | 5,806,790.00 |
| රජයේ ප්‍රතිපාදන - ප්‍රාග්ධන | | 1,572,047.00 | | 973,273.00 |
| බෙහෙත් ශාලා ගාස්තු | 151,020.00 | | 153,650.00 | |
| උපචිත බෙහෙත් ශාලා ගාස්තු | | 25,200.00 | | 16,200.00 |
| වාර්ෂික ක්ෂය කිරීම් | 176,673.00 | | 119,312.00 | |
| ක්ෂය වෙනිකිරීමේ ගිණුම | | 1,027,710.00 | | 851,037.00 |
| වෙන්කල අරමුදල් ගිණුම | | | | |
| වාර්ෂික ගාස්තු | | 13,500.00 | | 11,850.00 |
| බැංකු පොලී ආදායම් ගාස්තු | | 85,056.00 | | 112,419.00 |
| විවිධ ආදායම් | | 9,137.00 | | 22,370.00 |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | | 27,459.00 | | 27,459.00 |
| මුදල් ශේෂය - කොමර්ෂල් බැංකුව | 1,483,419.00 | | 1,405,167.00 | |
| මුදල් ශේෂය - ලංකා බැංකුව | 445,565.00 | | 422,928.00 | |
| සුළු මුදල් | | | | |
| සංග්‍රහ වියදම් | 56,448.00 | | 11,307.00 | |
| උපචිත සංග්‍රහ වියදම් | | 796.00 | | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 24,581.00 | | 15,389.00 | |
| උපචිත ලිපිද්‍රව්‍ය වියදම් | | 780.00 | | |
| උපචිත වෛද්‍ය සහා රැස්වීම් ගාස්තු | | 16,000.00 | | 20,000.00 |

| | 2014.12.31 දිනට ශේෂ පිරික්සුම | | 2013.12.31 දිනට ගිණුම් නිවැරදි කිරීමෙන් පසු ශේෂ පිරික්සුම | |
|---|---|---|---|---|
| හෝමියෝපති විභාග ගාස්තු | 684,017.00 | | | |
| උපචිත හෝමියෝපති විභාග ගාස්තු | | 310,630.00 | | |
| දැන්වීම් ගාස්තු | | | 141,208.00 | |
| භාෂා පරිවර්තන ගාස්තු | 46,381.00 | | 14,601.00 | |
| උපචිත භාෂා පරිවර්තන ගාස්තු | | 22,213.00 | | |
| උපචිත කාර්යාල උපකරණ අලුත්වැඩියා | | | | 16,744.00 |
| නීති ගාස්තු | | | 142,000.00 | |
| දැයට කිරුළ වැය | | | 20,306.00 | |
| දේපල පිරියත හා උපකරණ | 2,323,316.00 | | 1,725,992.00 | |
| ගොඩනැගිලි පුනරුත්තාපන වැය | 953,828.00 | | 953,828.00 | |
| ප්‍රාග්ධන ගිණුම | | 2,562,144.00 | | 2,562,144.00 |
| 2013.12.31 දිනට ඌනතා ගිණුමේ ශේෂය | 141,282.00 | | 29,305.00 | |
| එකතුව | **12,051,169.00** | **12,051,169.00** | **10,602,626.00** | **10,602,626.00** |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හෝමියෝපති අතුරු පාලක කමිටුව විසින් දරණ බව සහතික කරමු.

| | | | |
|---|---|---|---|
| ..................... | ..................... | ..................... | ..................... |
| ලේඛකාධිකාරී | සභාපති | කමිටු සාමාජික | සකස් කළේ, |
| හෝමියෝපති | හෝමියෝපති | හෝමියෝපති | ගණකාධිකාරී |
| වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | වෛද්‍ය සභාව | දේශීය වෛද්‍ය |
| | | | අංශය |

විජිකා සෙනවිරත්න
අතිරේක ලේකම් (පාලන)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
අංක.325, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත
කොළඹ 08.

කොළඹ 10.

ඩබ්.ඒ.සී.එස්. ප්‍රියදර්ශනී
ගණකාධිකාරී 1 පන්තිය
හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දේශීය වෛද්‍ය අංශය
325 ආචාර්ය ඇන්.එම්. පෙරේරා මාවත
කොළඹ - 08.

| ස්කන්ධය වෙනස්වීම් | සංචිත<br>රු. |
|---|---|
| ආරම්භක ශේෂය (2014.01.01 දිනට) | 2,562,144.00 |
| | |
| රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනය | 1,572,047.00 |
| | |
| පෙර වර්ෂ ගැලපුම් | 27,459.00 |
| | |
| සමුච්චිත ඌනතාවය / අතිරික්තය | (311,918.00) |
| | |
| වර්ෂය අවසානයේ ශේෂය (2014.12.31 දිනට) | 3,849,732.00 |
| | |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No.: එච්එම්/බී/එච්එම්සී/ 1/14/02

මබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2015 ඔක්තෝබර් 12 දින.

සභාපති,

හෝමියෝපති වෛද්‍ය සභාව.

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2015 අගෝස්තු 11 දින නිකුත් කරන ලදී.

**1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හෝමියෝපති වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රජයේ ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගන්නා වත්කම් ක්ෂය කර තිබූ නමුත් ක්‍රමක්ෂය සම්බන්ධව ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,572,047 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානයෙන් මිලදීගත් වත්කම්වල ශුද්ධ අගය රු.1,494,531 ක් විය.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පිරිවැය රු. 34,000 ක් වූ වෛද්‍ය උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කරනවා වෙනුවට පුනරාවර්තන වැය යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා පිරියත හා උපකරණ එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

## 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය | කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 395(ඇ) | එක් එක් මාසය අවසානයේදි ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළග මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කල යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුලදී සභාවේ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය රු. 170,636 ක ඌනතාවයක් වූ අතර එයට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.111,977 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 58,659 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 3.2 ආයතනයට එරෙහිව ඇති නෛතික සිද්ධි

වෛද්‍ය සභාවේ සේවය කල නිලධාරියෙකු විසින් ඔහුව සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව රු.3,000,000 ක වන්දි ඉල්ලා නඩුවක් ගොනුකර තිබුණු අතර, ආයතනය විසින් විවිධ කාර්යයන්ට අදාළව නඩු 06 ක් ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 22 වගන්තියේ සඳහන් පහත අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද නොහැකි වී තිබුණි.

(i) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා පර්යේෂණ හා අධ්‍යයන ධෛර්යමත් කිරීම.

(ii) හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය, ආනයනය, විකිණීම හා බෙදාහැරීම සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

(ආ) දිවයිනේ ප්‍රදේශ හතක් තුළ පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සායන හතෙහි රෝගී සහභාගීත්වය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 31 සිට සියයට 1.5 දක්වා අඩු වී තිබුණි. කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන සිටි වෛද්‍යවරුන්ගේ සේවා කාලය 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් එයට වෛද්‍යවරුන්ගේ විරෝධය එල්ලවීම මෙම තත්ත්වයට හේතුවක් වී ඇති බැව් අතුරු පාලක කමිටුවේ සභාපති විසින් පිළිතුරු සපයා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෝමියෝපති තාවකාලික වෛද්‍යවරුන් ලෙස ගැසට් පත්‍රයේ පලකර තිබූ වෛද්‍යවරුන් 212 දෙනෙකු විසින් හෝමියෝපති පනතේ 27(5) වගන්තියට අනුව විභාගයක් පවත්වා සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි කරන ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තිබුණි. එම නඩුවේ තීන්දුව මගින් ප්‍රකාශයට පත් කළ ලිඛිත විභාගය වෙනුවෙන් පුවත්පත් දැන්වීම් ගාස්තු ලෙස රු.155,680 ක් හා විභාගය පැවැත්වීමේ වියදම් ලෙස රු.684,017 ක් දරා තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෛද්‍යවරු 212 දෙනාගෙන් පුවත්පත් දැන්වීමට අනුව 38 දෙනෙක් පමණක් විභාගය සඳහා අයදුම් කර තිබුණු අතර, 19 දෙනෙක් පමණක් විභාගය සමත් වී තිබුණි.

(ii) මේ අනුව පෞද්ගලික ලිපිනයන්ට දැනුම් දීමට කටයුතු නොකිරීම තුල වෛද්‍යවරුන්ට විභාගයට අයදුම් කිරීමට අවස්ථාවක් මගහැරී තිබුණේද යන්න පිළිබඳව විගණනයේදී මතභේදාත්මක විය.

(ආ) අතුරු පාලක කමිටු රැස්වීම් මගින් තීරණය කරනු ලැබූ පහත සඳහන් කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් සිදු කර නොතිබුණි.

(i) 2012 ජනවාරි 05 දිනැති රැස්වීමේදී වෛද්‍ය සායන හතක් සඳහා පොදු නියෝග මාලාවක් සැකසීමට ගත් තීරණය.

(ii) 2013 අගෝස්තු 29 දිනැති රැස්වීමේදී නව සායන 14 ක් සඳහා තනතුරු අනුමත කරවා ගැනිමටද, හෝමියෝපති අධ්‍යාපන ආයතනය පිළිබඳ රීතින් හා අවශ්‍යතා ගැසට් කිරීමට ගත් තීරණය.

(iii) 2014 ජනවාරි 08 දිනැති රැස්වීමේදී හෝමියෝපති බෙහෙත් නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම පිළිබඳව 1981 හෝමියෝපති නියෝග තවදුරටත් පුළුල් කරමින් ප්‍රමාණවත් පරිදි නීති, රෙගුලාසි සකස් කිරීමට ගත් තීරණය.

### 4.3 නිෂ්කාර්ය වත්කම්

2009 වර්ෂයේදී හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය වෙනුවෙන් මිලදීගත් එකතුව රු.1,199,254 ක් වූ ස්ථාවර වත්කම්ද, ඊට අදාල ගොඩනැගිල්ල හා සමාලෝචිත වර්ෂය තුළ සායන සඳහා මිලදීගෙන තිබූ රු. 173,506 ක් වටිනා ස්ථාවර වත්කම් 2015 ජුලි 20 දින වන විටත් සභාවේ නිෂ්කාර්යව පැවති බැව් නිරීක්ෂණය විය.

### 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 19 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 18 ක් වූයෙන් කළමනාකරණ සහකාර තනතුරක ඌනතාවයක් පැවතුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය තුළදීද හෝමියෝපති වෛද්‍ය සභාව අතුරු පාලක කමිටුවක් යටතේ ක්‍රියාත්මක වූ අතර සභාවේ සියලු වියදම් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් අදාල වැය ශීර්ෂය යටතේ සිදු කර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අමාත්‍යාංශය විසින් සිදු කරන ලද සියලු වියදම්වල එකතුවට සමාන මුදලක් වෛද්‍ය සභාවට ලබාදුන් ප්‍රතිපාදන ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 දෙසැම්බර් 31 දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි විය.

(අ) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා නිසි පිළිගැනීමක් ලබාදීම සඳහා පහත උපායමාර්ග අනුගමනය කිරීමට සැලැසුම් කර තිබුණද ඒවායේ ප්‍රගතිය පහත පරිදි විය.

(i) ප්‍රතිකාර ලබාදීම තුලින් මහජන විශ්වාසය ගොඩනැගීම සඳහා ජංගම සායන 21 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, ඉන් සායන 12 ක් ම පවත්වා නොතිබුණි.

(ii) වැඩිහිටියන් සහ ළමුන් තුල වෛද්‍ය ක්‍රමය පිළිබඳ විශ්වාසය ගොඩනැගීම සඳහා පාසැල් වැඩසටහන් 03 ක් හා සාකච්ඡා සහ සම්මන්ත්‍රණ තුනක් පැවැත්වීමට යෝජිතව තිබුණු නමුත් එක් පාසැල් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණු අතර, සාකච්ඡා හා සම්මන්ත්‍රණ පවත්වා නොතිබුණි.

(iii) අමාත්‍යාංශයේ සහ සියලුම ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මූලික හැඳින්වීමක් ලබාදීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීමට සැලසුම් කර තිබුණ නමුත් කිසිදු සම්මන්ත්‍රණයක් පවත්වා නොතිබුණි.

(iv) මාධ්‍ය මගින් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ ප්‍රචාරයක් ලබාදීම සඳහා රූපවාහිනී හා ගුවන් විදුලි සාකච්ඡා 05 ක් සංවිධානය කිරීමටද, Web Home Page එකක් ආරම්භ කිරීමටද සැලසුම් කර තිබුණද, එම කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි.

(v) හෝමියෝපති වෛද්‍යවරුන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා හෝමියෝපති වෛද්‍යවරුන්ගේ සේවය සහ අත්දැකීම් ඇගයීමේ වැඩමුළු 02 ක් සංවිධානය කර තිබුණද එක් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි.

(ආ) හෝමියෝපති සභාව සඳහා පිළිගත් නිශ්චිත පරිපාලන පරිපාටියක් හඳුන්වාදීම සඳහා සභාවේ පරිපාලන ප්‍රතිපත්තිය පිළිබඳ රෙගුලාසි සම්පාදනය කිරීම සඳහා කමිටුවක් පත් කර, කමිටු කෙටුම්පත අනුමත කරවාගෙන, අවසාන කෙටුම්පත සකස් කර, අමාත්‍යවරයා මගින් රෙගුලාසි සම්මත කර ගැසට් කිරීම සිදු කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වන විට සැලසුම් කර තිබුණද, විගණිත දිනය වූ 2015 ජූලි 20 දින දක්වාත් කටයුතු කර නොතිබුණි.

(ඇ) හෝමියෝපති මහජන සෞඛ්‍ය සේවාවක් ප්‍රතිෂ්ඨාපනය කිරීමට සැලසුම්කර තිබුණද එය සිදුකර නොතිබුණි.

(ඈ) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් බිහිකිරීම හා පරිපූරක වෛද්‍යවරුන් බිහිකිරීම සහ ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා අතුරු නීති සම්පාදනය, පිළිගැනීම සහ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය පිහිටුවීමට සැලැසුම් කර තිබුණද, එම අරමුණද ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) හෝමියෝපති ඖෂධ නිෂ්පාදන පිළිබඳ වෙළඳපොළ සුලභතාවය තහවුරු කිරීම සඳහා අතුරු නීති සම්පාදනය සහ හෝමියෝපති බෙහෙත් ගබඩා සහ ඔසුසල් පිහිටුවීම සඳහා අරමුදල් ගොඩනැගීමට අදාල කටයුතු සමාලෝචිත වර්ෂය තුල සිදු කල යුතු වුවද එම කටයුතු ද සිදු කර නොතිබුණි.

(ඊ) ඖෂධ තොග ආනයනය සහ බෙදාහැරීම ජූලි මාසය වන විට කලයුතු බවට සැලසුම් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසදීමේදී සියයට 74 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.4 පොදු ව්‍යාපාර කාරක සභා නියෝග ඉටු නොකිරීම**

2010 සැප්තැම්බර් 15 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාවේ සාකච්ඡා සටහන ප්‍රකාරව වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි සභාවේ රෙගුලාසි යාවත්කාලීන කළයුතු බවට නියෝග කර තිබුණද, වර්තමානයේදීද වෛද්‍ය සභාවක් පත්කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම රෙගුලාසි යාවත්කාලීන කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) වාර්ෂික ලියාපදිංචි ගාස්තු

(ආ) බැංකු සැසඳුම්

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)